# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.08.28 පැය 1650 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/1660/2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**අඹේපුස්ස, රන්ගල් ගුහාව පුරාණ ශ්‍රී පත්තිනි දේවාලයේ දේව පෙරහර හේතුවෙන් නුවර කොළඹ ප්‍රධාන මාර්ගයේ රථ වාහන ගමනාගමනය සීමා කිරීම.**

වරකාපොල පොලිස් වසමේ අඹේපුස්ස, රන්ගල ගුහාව පුරාණ ශ්‍රී පත්තිනි දේවාලයේ වාර්ෂික දේව පෙරහර 2025.08.28 වන අද දින සවස 06.00 සිට කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

මෙම පෙරහර ඉහත දේවාලයෙන් ආරම්භ කර අඹේපුස්ස දේවාල හන්දියෙන් කොළඹ නුවර ප්‍රධාන මාර්ගයට පිවිස එම මාර්ගයේ නුවර දෙසට ගමන් කර අඹේපුස්ස හන්දිය, මාහේන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හන්දිය, මාහේන වංගුව දක්වා ගමන් කර නැවතත් එම මාර්ගයේම දේවාලය වෙත ගමන් කිරීමට නියමිතය.

පෙරහර ගමන් කරන කාලය තුලදී කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ රථ වාහන තදබදයක් ඇති විය හැකි බැවින් එම කාලය තුළ මෙම මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන්ට පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- කොළඹ නුවර මාර්ගයේ කොළඹ දෙස සිට පැමිණෙන රථ වාහන පස්යාල හන්දියෙන් නිට්ටඹුව ගිරිඋල්ල මාර්ගය ඔස්සේ මීරිගමට ගොස් අධිවේගී මාර්ගය භාවිතා කරමින් කුරුණෑගල දෙසට සහ මහනුවර දෙසට ගමන් කළ හැකිය.

- කොළඹ නුවර මාර්ගයේ කොළඹ දෙස සිට පැමිණෙන වාහන වේවැල්දෙනිය හන්දියෙන් වේවැල්දෙනිය මීරිගම මාර්ගයේ ගමන් කර මීරිගමින් අධිවේගී මාර්ගය භාවිතා කරමින් කුරුණෑගල දෙසට හා මහනුවර දෙසට ගමන් කළ හැකිය.

- කොළඹ නුවර මාර්යේ නුවර දෙස සිට කොළඹ දෙසට පැමිණෙන වාහන නෙළුන්දෙණිය හන්දියෙන් නෙළුන්දෙනිය අලව්ව මාර්ගය භාවිතා කළ හැකිය.

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**